www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# යුද අපරාධකරුවන්ගේ ජාත්‍යන්තර සංගමය

**The international league of war criminals**

2009 දෙසැම්බර් 17

ඊශ්‍රායලයේ හිටපු විදේශ ඇමතිවරිය ද වත්මන් විපක්ෂ නායිකාව ද වන ට්සිපි ලිව්නි අත් අඩංගුවට ගැනීමට බ්‍රිතාන්‍යයෙන් වරෙන්තුවක් නිකුත් වී ඇත. එය හුදෙක් ඊශ්‍රායලය පලස්තීනයන්ට සලකන ආකාරය මත ඊට එරෙහිව යුද අපරාධ පිලිබඳ නඩු විභාගයක් කල යුතු බවට ජාත්‍යන්තර නෛතික ආයතනයකින් සනාථ කෙරුනු මෑත ම අවස්ථාව වනවා පමනකි.

2008 දෙසැම්බර් 27 වන දා සහ මේ වසරේ ජනවාරි 18 වන දා අතර කාලයෙහි ගාසාවට එරෙහිව දියත් කල "ඔපරේෂන් කාස්ට් ලෙඩ්" නමින් හැඳින්වුනු ආක්‍රමනික යුද මෙහෙයුම අතරතුර දී ලිව්නි යුද කැබිනට්ටුවේ සාමාජිකාවකව සිටියා ය. මෙහෙයුමෙන් පලස්තීනයෝ 1,400ක් පමන " ඔවුන්ගෙන් බහුතරය සිවිල් වැසියන් ය, ඉනුදු 400ක් ම කාන්තාවන් සහ ලමුන් ය " ඝාතනයට ලක් වූහ, 5,000ක් ආසන්න වශයෙන් ජනයා තුවාල ලදහ, නිවාස 21,000ක් සහ වෙනත් යටිතල පහසුකම් විනාශ විය.

ඔක්තෝබරයේ දී, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම දකුනු අප්‍රිකානු විනිසුරුවරයෙකු වූ රිචර්ඩ් ගෝල්ඩ්ස්ටෝන් ඉදිරිපත් කල වාර්තාවක් පිලිගත්තේ ය. එය ප්‍රකාශ කරන පරිදි, මෙම යුද්ධය "සිවිල් ජනතාවකට දඬුවම් පැමිනවීම, නින්දා කිරීම සහ ඔවුන් ත්‍රස්ත කිරීම සඳහා, රැකියාවල යෙදී තම ජීවිකාව සරි කර ගැනීමට පවතින දේශීය ආර්ථික හැකියාව අත්‍යන්තයෙන් ම හීන කිරීම සඳහා සහ එන්න එන්න ම කිසි දා නොවූ තරමට පරාධීන වීමට සහ අන්තරායට පත් වීමට බල කිරීම සඳහා සැලසුම් කල, හිතාමතා ම එල්ල කරන ලද විසමානුපාතික ප්‍රහාරයක්" විය.

පලස්තීන පැමිනිලිකරුවන් 16 දෙනෙකුගේ නීතිඥයන් කල ඉල්ලීමක් මත වෙස්ට්මිනිස්ටර් මහේස්ත්‍රාත් අධිකරනය ලිව්නිට එරෙහි වරෙන්තුව නිකුත් කලේය. ලිව්නි දෙසැම්බර් 13 වන දා යුදෙව් ජාතික අරමුදල් සම්මේලනය අමතන්නට නියමිතව සිටි මුත් "න්‍යාය පත්‍රය පිලිබඳ ගැටලුවක්" නිසා කලකට පෙර ඇය සිය සහභාගිත්වය අවලංගු කල බව කියැවේ. කෙසේ වුව ද, වරෙන්තුව සහ අත් අඩංගුවට ගැනීමේ තර්ජනය ගැන ලිව්නිට රහසේ සැලවූ බව නිව් යෝක් ටයිම්ස් පුවත්පත බ්‍රහස්පතින්දා වාර්තා කලේ ය.

මෙය ඊශ්‍රායල දේශපාලනඥයෙකු හෝ මිලිටරි නිලධාරියෙකු චෝදනාවට ලක් වීමේ තර්ජනයට මුහුන පෑ පලමු වතාව නො වේ. පලමුව එවැන්නක් සිදු වූයේ මීට බොහෝ කලකට පෙර 2001 දී ය. ඒ අවස්ථාවේ, 1982 දී සිදු කෙරුනු සබ්රා සහ ෂටිලා ජන සංහාරයන්හි දී ඉටු කල ක්‍රියා කලාපය සම්බන්ධයෙන් හිටපු අගමැති ඒරියල් ෂැරොන්, හිටපු හමුදා කාර්ය මන්ඩල ප්‍රධානි රෆායෙල් අයිටන් සහ ඊශ්‍රායල ආරක්ෂක හමුදාවේ (අයිඩීඑෆ්) උතුරුදිග බලඇනියේ හිටපු ආඥාපති අමොස් යාරොන් අත් අඩංගුවට ගැනීමට බෙල්ජියමෙහි වරෙන්තුවක් නිකුත් විය.

2005 සැප්තැම්බරයේ දී, පලස්තීන සිවිල් වැසියන්ට අයත් නිවාස 59ක් බිඳ හෙලීම සම්බන්ධයෙන් අයිඩීඑෆ් දකුනුදිග බලඇනියේ හිටපු ආඥාපති ඩොරොන් අල්මොග් එක්සත් රාජධානියේ දී අත් අඩංගුවට ගැනීමට මුහුන පෑවේ ය. අත් අඩංගුවට ගැනීමේ වරෙන්තුව නිකුත් වූයේ එක්සත් රාජධානියේ නීතිය යටතේ රහසේ බව කියැවේ. එහෙත් ඊශ්‍රායල රාජ්‍ය තාන්ත්‍රිකයන්ට ඒ බව සැල විය. නැවත ඊශ්‍රායලය බලා පිටත් වන තුරු දෙපැයක් තිස්සේ ම අල්මොග් සිය ගුවන් යානයෙන් පිටවීම ප්‍රතික්ෂේප කලේ ය.

2002 ජුලි මාසයේ දී ගාසාවෙහි පිහිටා තිබූ නිවහන් ගොඩනැගිල්ලකට බෝම්බ ප්‍රහාරයක් එල්ල කිරීමට සම්බන්ධ වූ ඊශ්‍රායල ජාතිකයන් සත් දෙනෙකු උදෙසා ස්පාඤ්ඤයෙන් ද අත් අඩංගුවට ගැනීමේ වරෙන්තුවක් නිකුත් විය. හමාස් මිලිටරි නායක සලාහ් ෂෙහාදි ද ඔහුගේ බිරිඳ සහ දරුවන් සත් දෙනෙකු ද ඇතුලු සිවිල් වැසියන් 14 දෙනෙක් එම ප්‍රහාරයෙන් ඝාතනයට ලක් වූහ. ඊශ්‍රායල නියෝජ්‍ය අගමැතිවරයා සහ මූලෝපායාත්මක කටයුතු පිලිබඳ ඇමතිවරයා වන මෝෂේ යාලොන් සහ හිටපු ආරක්ෂක ඇමති බෙන්ජමින් බෙන්-එලයිසර් ද චූදිතයන් අතර සිටියහ.

සැප්තැම්බරයේ දී, ගාසා යුද්ධයට සම්බන්ධ වීම නිසා 1988 අපරාධ යුක්ති පනත යටතේ ඊශ්‍රායල ආරක්ෂක ඇමති එහුඩ් බැරැක් අත් අඩංගුවට ගැනීමේ වරෙන්තුවක් නිකුත් කරන ලෙස වෙස්ට්මිනිස්ටර් අධිකරනයෙන් ඉල්ලා සිටිනු ලැබිනි. ඔහු සිය බ්‍රිතාන්‍ය සමපාර්ශවකරුවන් හමු වීමට ගිය සේවා ඇමතිවරයෙකු බවටත් එම නිසා 1978 රාජ්‍ය මුක්ති පනත යටතේ ලද

මුක්තිය භුක්ති විඳි බවටත් විදේශ කාර්යාලයෙන් ඉදිරිපත් වූ තහවුරු කිරීමේ ප්‍රකාශය අධිකරනයේ පිලිගැනීමට ලක් විය.

නිල කටයුත්තකට නොගිය ලිව්නි වැනි හිටපු ඇමතිවරු එවැනි කිසිදු මුක්තියක් භුක්ති නො විඳිති. මේ හේතුව නිසා, මහජන ආරක්ෂක ඇමති සහ ෂින් බෙට් ආරක්ෂක ඒජන්සියේ ප්‍රධානි යාලොන් සහ අවි ඩිච්ර් යන දෙදෙනා ම බ්‍රිතාන්‍යයෙහි පැවැත්වෙන උත්සව සඳහා ලද ආරාධනා ප්‍රතික්ෂේප කර ඇත.

ඊස්රායල අගමැති බෙන්ජමින් නෙතන්යාහුගේ ආන්ඩුව ජිනීවා සම්මුතියේ සහ වෙනත් ජාත්‍යන්තර නීතිවල ජගත් අධිකරන බල විධිවිධාන යටතේ සිදු විය හැකි අනාගත අත් අඩංගුවට ගැනීම් අවසන් කිරීමේ උද්ඝෝෂනයක් සංවිධානය කර ඇත. කෙසේ වුව ද, ඊස්රායල මිත්‍ර පාක්ෂිකයන් සිතන පරිදි නම් ටෙල් අවිව් පාලනය පා පහර දෙමින් සිටින්නේ විවෘත දොරටුවකට ය.

ඊස්රායල නිලධාරියෙකු චෝදනාවට ලක් වීමේ තර්ජනයට මුහුන දුන් හැම විට ම වොෂින්ටනය එය වැලැක්වීමට බල කිරීම සඳහා පීඩනය යොදා ඇත. මෙය ෂැරොන්ට සහ තවත් අයට එරෙහිව බෙල්ජියම ඉදිරිපත් කල චෝදනා ඉවත් කර ගැනීමට ද අනාගතයේ දී මීට සමාන චෝදනා ඉදිරිපත් වීමට ඇති ඉඩකඩ අඩු වන පරිදි බෙල්ජියානු නීතිය වෙනස් වීමකට ද මග පෑදී ය. මෙම වසරේ ජූනි මාසයේ දී, ස්පාඤ්ඤ අධිකරනයක් ගාසා නගරයෙහි සිදු වූ බෝම්බ ප්‍රහාර පිලිබඳ සිය පරීක්ෂනය පසෙක ලී ය. මීට අමතරව, ජාතීන් හයකින් සැදුම් ලත් කන්ඩායමකට නායකත්වය දෙමින් එක්සත් ජනපදය ගෝල්ඩ්ස්ටෝන් වාර්තාව පිලිගැනීමට එරෙහිව ඡන්දය දුන්නේ ය. බ්‍රිතාන්‍යය සහ ප්‍රන්සය ඡන්දය දීමෙන් වැලකී සිටියහ.

ලිව්නි සම්බන්ධයෙන් නිකුත් කල වරෙන්තුවට එරෙහිව ඊස්රායලය කල නිල විරෝධය පෑම්වලට බ්‍රිතාන්‍යය දැක්වූ ප්‍රතිචාරය යටහත් පහත්කමකට වැඩි දෙයක් විය. එය තුඩු දුන්නේ බ්‍රිතාන්‍ය අධිකරන ඉදිරියට පුරවැසියන් නොවන්නන් පැමිනවීමට ඉඩ ලැබෙන නීතිය වෙනස් කිරීමට විදේශ ලේකම් ඩේවිඩ් මිලිබෑන්ඩ් සහ අගමැති ගෝර්ඩන් බ්‍රවුන් පොරොන්දු වීමට ය.

යථා අධිරාජ්‍යවාදී දේශපාලනයේ නග්න භාෂාවෙන් මිලිබෑන්ඩ් කියා සිටියේ මෙය යි: "ඊස්රායලය එක්සත් රාජධානියේ මූලෝපායාත්මක හවුල්කරුවෙක් සහ සමීප මිතුරෙක්. ඒ බැඳීම් ආරක්ෂා කිරීමට සහ වර්ධනය කිරීමට අප අධිෂ්ඨාන සහගතව සිටිනවා." ජාත්‍යන්තර නීතිය සහ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් නගා සිටුවීම පිලිබඳ බටහිරයන්ගේ කියා පෑම් ගැන ඒ ප්‍රමානවත් ය!

එක්සත් ජනපදය ගත් ආස්ථානය සමග සසඳන කල, එක්සත් රාජධානියේ ප්‍රතිචාරය තුල මිත්‍ර පාක්ෂිකයෙකුට දක්වන පක්ෂපාතිත්වයට වැඩි යමක් ඇත. එහි ස්වයං ආරක්ෂාව පිලිබඳ මූලික ගැටලුවක් ගැබ්ව පවතී.

ඉරාකය සම්බන්ධයෙන් ජෝර්ජ් බුෂ් සහ ටෝනි බ්ලෙයාර් ද ඇෆ්ඝනිස්ථානය සම්බන්ධයෙන් බ්‍රවුන් සහ ජනාධිපති බැරැක් ඔබාමා ද ඇතුලු ප්‍රධාන බලයන්ගේ නායකයන් ජගත් අධිකරන බල විධිවිධාන යටතේ චෝදනාවට ලක් වීමේ තර්ජනයට මුහුන දී සිටින බවට ඊස්රායල ප්‍රකාශකයන් නොයෙක් විට අනතුරු අඟවා ඇත. "ඒක අප විතරක් මුහුන දෙන ගැටලුවක් නෙවි.... ඒ ගොල්ලො අයිඩීඑෆ් නිලධාරීන්ට, අයිඩීඑෆ් ආඥාපතීන්ට, අයිඩීඑෆ් සොල්දාදුවන්ට, අයිඩීඑෆ් ගුවන් නියමුවන්ට සහ නායකයන්ට වුනත් චෝදනා කරනව නම්, ඒ කියන්නෙ ඒ ගොල්ලො ඔබටත් චෝදනා කරාවි. මොක ද, නේටෝව ඉන්නෙ නොයෙක් තැන්වල සටන් කරමින් නෙවි ද? මොක ද, රුසියාව ඉන්නෙ නොයෙක් තැන්වල සටන් කරමින් නෙවි ද?" යැයි පවසමින් ගෝල්ඩ්ස්ටෝන්ගේ වාර්තාව සම්බන්ධයෙන් නෙතන්යාහු මත් අනතුරු ඇඟවී ය.

යම් කරුනක් මානව වර්ගයාට එරෙහි අපරාධයක් යැයි සැලකෙන විට ජාත්‍යන්තර හෝ ජාතික අධිකරනයකින් චෝදනා ඉදිරිපත් කිරීමට ජගත් නීතිය පිලිබඳ සංකල්පයෙන් ඉඩ සැලසුනත්, චෝදනාවට ලක් වී ඇතැයි කියනු ලබන පාර්ශ්වයේ ම රාජ්‍යය තුල එම නඩුව විභාග කිරීමට ඉන් ඉඩ සැලසී නැත. 2002 දී ජාත්‍යන්තර අපරාධ අධිකරනය (අයිසීසී), පෙර පැවති යුගෝස්ලාවියාව සම්බන්ධයෙන් ඇති කල ජාත්‍යන්තර අපරාධ විනිශ්චය සභාව සහ ජාත්‍යන්තර යුක්ති අධිකරනය (අයිසීජේ) වැනි ආයතන මාලාවක් නිර්මානය වීමට පදනම වැටුනේ එයිනි. සිය අවශ්‍යතාවන්ට සතුරු යැයි සලකා ඉලක්ක කර ගෙන සිටින සර්බියාව වැනි පාලන තන්ත්‍රයනට එරෙහිව මෙම ආයතන යොදා ගැනීම ගැන එක්සත් ජනපදය සහ වෙනත් ප්‍රධාන බලවත්තු සතුටට පත්ව සිටිති. එහෙත් ඊස්රායලය මෙන් ම එක්සත් ජනපදය ද තමන්ට එරෙහිව ජගත් අධිකරන බලය ක්‍රියාත්මක වීමට විරුද්ධත්වය පායි. එම නිසා ඔවුහු අයිසීසීය වත් අයිසීජේය වත් අනුමත නො කරති.

පසු ගිය සතියේ ඔබාමා නොබෙල් සාම ත්‍යාගය පිලිගැනීමේ කතාව කරද්දී යුද්ධය යනු එක්සත් ජනපද විදේශ ප්‍රතිපත්තියේ - එනම්, කිසි යම් රටක් "ස්වයං ආරක්ෂාව හෝ ආක්‍රමනිකයෙකුට එරෙහිව තනි ජාතියක ආරක්ෂාව සලසා ගැනීම ඉක්මවන" අරමුනකින් යුතුව ගන්නා මිලිටරිමය පියවරයන් ආරක්ෂා කිරීමේ - මෙවලමක් යැයි ඔහු විවෘතව ම තර්ක කලේ ය. දෙවන ලෝක යුද්ධයෙන් පසුව පිහිටුවා ගැනුනු "සාමය පවත්වා ගෙන යාමේ ව්‍යුහයේ" කේන්ද්‍රයෙහි තමන්ට හිමිව තිබෙන තත්ත්වය රැක ගැනීම සඳහා - ඉරාකයෙහි සහ ඇෆ්ඝනිස්ථානයෙහි දැනට මත් මෙහෙයවා ඇති වර්ගයේ - එවැනි පූර්ව භංග යුද්ධ එක්සත් ජනපදයට අත්‍යවශ්‍ය වූ බව ඔහු අවධාරනය කලේ ය.

මීට "ඇතැම් චර්යාමය රීති" පිලිපැදීම ද ඇතුලත් බව කියැවෙතත් එක්සත් ජනපදය ක්‍රියා කරන්නේ

"යුද්ධය මෙහෙයවීමේ නියමුවෙකු" විලසිනි. මෙම අවසාන අරමුන කරා ලඟා වීම සඳහා, "ජිනීවා සම්මුතීන්" ද "යුද්ධය පිලිබඳ වෙනත් ජාත්‍යන්තර නීති" ද "පිලිපැදීම සඳහා ඇමරිකාවට ඇති කැප වීම" පෞද්ගලිකව ම යලි තහවුරු කිරීමේ දැවැන්ත සූදුවක ඔහු නියැලී ගත්තේ ය.

මෙය වනාහි බොහෝ මුසාවන් අතර පවතින එක් බොරුවකි. හිටපු චිලියානු ආඥාදායක ඔගස්ටො පිනොචේ සම්බන්ධයෙන් ස්පාඤ්ඤ විනිසුරු බල්තසාර් ගාර්සොන් 1998 දී නිකුත් කල අපරාධකරු සිය රටට භාර දීමේ වරෙන්තුවත් සමග ස්පාඤ්ඤය සහ බ්‍රිතාන්‍යය ජගත් අධිකරන බලය පිලිබඳ සංකල්පයේ පුරෝගාමීන් බවට පත් වූයේ යැයි ඇතැම් පුවත්පත් ප්‍රකාශ කර ඇත. එහෙත් සැබවින් කියතොත්, සංකල්පයේ මුල් තිබෙන්නේ 1949 අගෝස්තු 12 වන දා සම්මත කර ගැනුනු ජිනීවා සම්මුතීන් තුල ය.

යුද අපරාධ සම්බන්ධයෙන් ගත් කල, අදාල සම්මුතීන් බ්‍රිතාන්‍යය සහ එක්සත් ජනපදය වැනි අත්සන්කාර ජාතීන්ගෙන් ඉල්ලා සිටින්නේ අවශ්‍ය නීති සම්මත කර ගෙන සම්මුතීන් "බැරෑරුම් ලෙස උල්ලංඝනය කෙරෙන" ඕනෑ ම අවස්ථාවක "වරදකාරී හෝ වරදකරු යැයි නියම කෙරෙන" පුද්ගලයන් සම්බන්ධයෙන් "බලාත්මක දන්ඩන සම්බාධක නියම කල යුතු" බව යි. 129 වන වගන්තිය ප්‍රකාශ කරන පරිදි, "වරදකාරී යැයි කියනු ලබන හෝ වරදකරුවෙකු යැයි නියම කෙරෙන පුද්ගලයන්, එවැනි බැරෑරුම් උල්ලංඝනයන් සම්බන්ධයෙන් සෝදිසියෙන් සිටීමට, ජාතිකත්වය නො තකා එවැනි පුද්ගලයන් තම අධිකරන හමුවට පැමිනවීමට" සෑම අත්සන්කරුවෙකු ම "වගකීමෙන් බැඳී සිටිය යුතු ය."

ගෝල්ඩ්ස්ටෝන් වාර්තාව යුද අපරාධ පිලිබඳව චෝදනා එල්ල කරන යට කී ඊස්රායල ජාතිකයන් මෙන් ම හමාස් නායකයන් ගැන ද සොයා බැලීම සඳහා තමන් සතු "ජගත් අධිකරන බලය" යොදා ගන්නා ලෙස සම්මුතීන්හි අත්සන්කාර රටවල් වෙත එම වාර්තාවෙන් පැහැදිලි කැඳවුමක් නිකුත් කෙරෙන්නේ එබැවිනි.

සැබවින් ම, අධිරාජ්‍යවාදී බලවතුන් සහ ඔවුන්ගේ මිත්‍ර පාක්ෂිකයන් ක්‍රියා කරන්නේ තම අන්‍යෝන්‍ය ආරක්ෂාව සහ ස්වයං ආරක්ෂාව සඳහා කැප වී ගත් යුද අපරාධකරුවන්ගේ තථ්‍ය ජාත්‍යන්තර සංගමයක් විලසිනි. තමන්ගේ මිතුරන්ට සහ තමන්ගේ ම දේශපාලනඥයන්ට සහ මිලිටරි කාර්ය මාන්ඩලිකයන්ට එරෙහිව යුද අපරාධ පිලිබඳ චෝදනා එල්ල වන විට එක්සත් ජනපදය ජගත් අධිකරන බලය ප්‍රතික්ෂේප කරන්නේ ඒ නිසයි.

දැන් බ්‍රවුන් සහ මිලිබෑන්ඩ් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදයේ මූලෝපායාත්මක අවශ්‍යතාවන්ට ප්‍රතිපක්ෂව දිවෙන යුද අපරාධ පිලිබඳ ඕනෑ ම චෝදනා කිරීමක් වලකනු වස් තමන් ද අධිකරනවලට පවතින ස්වාධීනත්වය අහෝසි කිරීමට කටයුතු කරන බව පැහැදිලි කර ඇත. එසේ කිරීමෙන් ඔවුන් බලාපොරොත්තු වනවා ඇත්තේ තමන් අධිකරනය හමුවට පැමිනවීමෙන් ගැලවී ගැනීම විය හැකි ය. එහෙත් ඇතැම් අපරාධ, චෝදනාවට ලක් වීම සඳහට ම මගහැර සිටීමට නොහැකි තරම් අතිදැවැන්ත ඒවා බව ඔවුන් දත යුතු ය.

ක්‍රිස් මාස්ඩන්

© www.wsws.org